| | |
|---|---|
| | ගැනීම පිණිස පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට ලක්කරයි. එම පියවර අතර පහත ද ඇතුලත් වේ:<br>අ. නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන්, අධිකරණ නිළධාරීන් සහ තැනැත්තන් වෙළදාම් කිරීම් සම්බන්ධ විමර්ශනයන්, පරීක්ෂණයන් සහ නඩු පැවරීම් සිදුකරන අදාල සෙසු නිළධාරීන් සඳහා පුහුණු සහ සංවේදීකෘත වැඩසටහන් ලබා දීම;<br>ආ. සම්මුතිය ක්‍රියාවට නැංවීම පිණිස කලාපීය කාර්යසාධක බලකායක් ස්ථාපිත කිරීම;<br>ඇ. සම්මුතිය ක්‍රියාවට නැංවීම පිණිස ද්විපාර්ශවීය යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම;<br>ඈ. තැනැත්තන් වෙළදාම් කිරීමට සම්බන්ධ සංවිධානයන්, ඔවුන් භාවිතා කරන ක්‍රමවේදයන් සහ ගොඩබිමෙන්, ජලයෙන් හා ගුවනින් භාවිතා කරන මාර්ගයන් සහ පරීක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනිම;<br>ඉ. රැකියාවට බඳවා ගැනීමේ මුවාවෙන් කාන්තාවන් සහ ළමුන් තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්කිරීම වැළැක්වීම පිණිස රැකියා සඳහා බදවා ගන්නා නියෝජිත ආයතයන් පිළිබද සුපරික්ෂාකාරී වීම ද ඇතුළුව තැනැත්තන් වෙළදාම් කිරීමට ලක් කරන ක්‍රම පිළිබඳව සුපරික්ෂාකාරී වීම;<br>ඊ. තැනැත්තන් වෙළදාම් කිරීමට හේතු වන සාධකයන් පිළිබදව මාධ්‍ය හරහා දැනුවත් කිරීම් සිදු කිරීම. |
| **IX**<br>**ව්‍යවස්ථාව** | තැනැත්තන් වෙළදාම් කිරීමේ වින්දිතයන්ට රැකවරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ නැවත මව් රටට යාමට සලසා දීම, එයට පහත ද ඇතුලත් වේ:<br>අ. වින්දිතයාව ඔහුගේ මව් රටට නැවත යැවීම<br>ආ. මව් රටට යවන තෙක් නෛතික සහය සහ සෞඛ්‍ය පහසුකම් සලසා දීම<br>ඇ. වින්දිතයන්ව පුනරුත්තාපනය කිරීම පිණිස රාජ්‍ය අනුග්‍රහය සහිත හෝ රාජ්‍ය අන්ග්‍රහය නොලබන රක්ෂිත ස්ථාන සහ රැකවරණ නිවහන ස්ථාපිත කිරීම<br>ඈ. වින්දිතයන්ට නෛතික සහය, සෞඛ්‍ය පහසුකම්, උපදේශනය සහ රැකියා පුහුණුව ලබා දීම |

## <u>තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබද නිර්වචනයඃ සංසන්දනයක්</u>

***සාර්ක් සම්මුතියේ 1 වන ව්‍යවස්ථාව***

"තැනැත්තන් වෙළදාම් කිරිමට යටත් වූ පුද්ගලයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව, මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා රට තුළ හෝ ඉන් පිටත, වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් හා ළමයින් එහා මෙහා ගෙන යාම, විකිණීම හෝ මිලදී ගැනීම".

***තැනැත්තන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් , වෙළදාම් කිරීම වැළැක්වීම මර්දනය කිරීම සහ දඬුවම් දීම සඳහා වන සංධානයේ (පැලමෝර් සංධානය) 3 වන ව්‍යවස්ථාව***

"තැනැත්තන් වෙළදාම් කිරීම යනුවෙන් සූරා කෑමේ අරමුණ ඇතිව, තර්ජනය කිරීම හෝ බලහත්කාරයෙන් හෝ වෙනත් ආකාරයේ බලකිරීම් මගින් පැහැරගෙන යාම, වංචාව, රැවටීම, බලය අයුතු ලෙස භාවිතාව හෝ අසරණභාවය හෝ වෙනත් පුද්ගලයෙකු පාලනය කිරීමට හැකි පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීමක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබාදීම හෝ ලබා ගැනීම මගින් පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, පවරා දීම, රැකවරණය ලබා දීම සහ භාර ගැනීම අදහස් විය යුතු ය. සූරාකෑම යන්නෙන්, අවම වශයෙන් අන් අයව වෛශ්‍ය වෘත්තියේ යෙදවීම හෝ වෙනත් යම් ආකාරයකින් ලිංගිකව සූරාකෑම, බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, වහල්භාවය හෝ වහල්භාවයට සමාන ක්‍රියා හෝ අවයව ඉවත්කර ගැනීම යන්න ඇතුලත් විය යුතු ය.

අ. තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබද සාර්ක් සම්මුතිය පැලමෝර් සංධානයේ භාවිතා කර තිබෙන පුළුල් නිර්වචනය අනුගමනය නොකරන අතර එය වාණිජ ලිංගික සූරාකෑම පමණක් ආවරණය කරනු ලබන වඩාත් සීමා සහිත නිර්වචනයට නැවත ගමන්කර තිබේ.

ආ. තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබද සාර්ක් සම්මුතිය තුල ඇතුළත් නිර්වචනය කාන්තාවන් සහ ළමුන් එහා මෙහා ගෙනයාම, විකිණීම හෝ මිලදී ගැනීමට පමණක් සීමා වන අතර ඒ තුළ පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, පවරා දීම, රැකවරණය ලබා දීම සහ භාර ගැනීම වැනි තැනැත්තන් වෙළදාම් කිරීමේ විවිධ අවස්ථාවන් සලකා බලා නොමැත.

ඇ. තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබද සාර්ක් සම්මුතිය හුදෙක් වෛශ්‍යා වෘත්තිය පිළිබද පමණක් අවධානය යොමු කළද සාර්ක් කලාපය තුල කාන්තාවන් සහ ළමයින් බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, අවයව ඉවත් කර ගැනීම විවාහය යනාදී ආකාරයන්ගෙන් සූරාකෑමට ලක් වේ. පැලමෝර් සංධානයේ නිර්වචනය තුල අවම වශයෙන් අන් අයව වෛශ්‍ය වෘත්තියේ යෙදවීම හෝ වෙනත් යම් ආකාරයකින් ලිංගිකව සූරාකෑම, බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, වහල්භාවය හෝ වහල්භාවයට සමාන ක්‍රියා හෝ අවයව ඉවත්කර ගැනීම යන්න ඇතුලත් වන ලෙස පුළුල්ව සූරාකෑම නිර්වචනය කර තිබේ.

ඇ. සාර්ක් සම්මුතිය තුල කාන්තාවන් සහ ළමුන් එක් අසරණ කණ්ඩායමක් වශයෙන් හදුනාගනු ලබන අතර එහිදී කාන්තාවන් වැඩිහිටියන් බවත් ළමුන් යනු විශේෂ රැකවරණය හා අවධානය අවශ්‍ය කණ්ඩායමක් බව හදුනා ගැනිමට සම්මුතිය අපොහොසත් වේ. එයට ප්‍රතිවිරුද්ධ ලෙස පැලමෝර් සංධානය වැඩිහිටි පුරුෂයන්, කාන්තාවන් සහ ළමුන් අතර වෙනසක් දක්වන අතර ළමයින් වෙළදාම් කිරීම යන්න සූරාකෑම සඳහා බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, පවරා දීම, රැකවරණය ලබා දීම සහ භාර ගැනීම ලෙස නිර්වචනය කරනු ලබයි. එම නිසා, වින්දිතයා ළමයකු වන අවස්ථාවක දී, අදාළ වෙළදාම් කිරීමේ ක්‍රියාව සඳහා කැමැත්ත ලබා දුන්නාය යන සාධකය අදාල නොවන අතර නිර්වචනයේ දක්වා ඇති ක්‍රමවේදය යොදාගෙන තිබේද යන්න ද අදාල නොවේ.

a. සාර්ක් සම්මුතිය කාන්තාවන්ට සහ ළමයින්ට පමණක් සීමා වන අතර එහි ලා විවිධ ආකාරයන්ගෙන් තැනැත්තන් වෙළදාම් කිරීම්වලට ලක් වන පුරුෂයන් බැහැර කර තිබේ.



**අභ්‍යාසය 4.3**

පැලමෝර් සංධානයේ සහ තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබද සාර්ක් සම්මුතියේ ඇති නිර්වචනයන් සංසන්දනය කර එවායේ ඇති සමානතා සහ අසමානතා වගුවක් ඇශ්‍රිතව දක්වන්න.

**2005 අංක 30 දරන වෛශ්‍ය වෘත්තිය සදහා කාන්තාවන් සහ ළමයින් වෙළදාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම පිළිබද සම්මුති පනත[56]**



තැනැත්තන් වෙළදාම් කිරීමට එරෙහිව පිළියම් යෙදීම පිණිස දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමට අමතරව 2005 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් *සාර්ක් සම්මුතිය* යටතේ වන වගකීම ඉටු කිරීම පිණිස මෙම පනත සම්මත කරන ලදී.

වෛශ්‍ය වෘත්තිය සදහා කාන්තාවන් සහ ළමයින් වෙළදාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහි සටන්කිරීම පිළිබද සම්මුති පනත (සාර්ක් සම්මුති පනත) තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීමට සහ ඊට නතු වූ, ලක් වූ කාන්තාවන් සහ ළමයින් පුනරුත්ථාපනය කිරීමට හා උදර්පණය කිරීමට අවශ්‍ය විධිවිධාන සලසයි. තවද, අපරාධ කාරණා පිළිබඳ අන්‍යෝන්‍ය සහය පනත[57] යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් අතර සහයෝගීතාවය ශක්තිමත් කරන අතර පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් නොවන රටවල් සමග පනත යටතේ ආණ්ඩුව විසින් ඇතිකර ගෙන තිබෙන එකගතාවයට අනුව දේශාන්තරව සිදුවන තැනැත්තන් වෙළදාම් කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට හා නඩු පැවරීම් ශක්තිමත් කිරීමට අදාල විධිවිධාන සලසයි.

---

[56] Act No. 30 of 2005.

[57] Act. No. 25 of 2002

පනත යටතේ පහත විධිවිධාන සලසනු ලබයි:

| **අ. එමඟින් කාන්තාවන් සහ ළමයින් වෙළඳාම් කිරීම යන වරද පහත පරිදි නිර්වචනය කරයි.** |
|---|
| අ. වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීමේ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ වෙනත් කාරණාවක් සඳහා |
| ආ. ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ යම් කොටසක් |
| ඇ. පවත්වා ගෙන යන, නඩත්තු කරන හෝ කළමනාකරණය කරන |
| ඈ. දැන දැනම මුදල් යොදවන හෝ මුදල් යෙදවීමට සහභාගි වන හෝ |
| ඉ. දැන දැනම බද්දට හෝ කුලියට දෙන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. |
| ඊ. ඒ සඳහා උත්සහ කරන උපකාර කරන සහ කුමන්ත්‍රණය කරන යම් කිසි පුද්ගලයකු එම සමාන වරද සඳහා වරදකරු වේ. |
| උ. අවම වසර 3කට සහ උපරිම වසර 15 ක් සඳහා අනිවාර්ය දඬුවමකට සහ දඩයකට යටත් වේ. |

*a.* මෙම පනත හරහා වින්දිතයින්ට වන්දි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයන අතර එසේ වන්දි ගෙවීමට අපොහෙසත් වන්නේ නම් තවත් වසර 5ක් සඳහා වරදකරුව බන්ධනාගාර ගත කිරීමක් නියම කල හැකි ය.

*b.* මෙම වරද යටතේ චෝදනා ලැබ සිටින දේශිය මෙන්ම විදේශීය චුදිතයන් පිළිබඳ නඩු විභාග කිරීමේ බලය මහාධිකරණයට ලබා දී ඇත.

*c.* මෙම පනත හරහා වරදේ බරපතල බව තීව්‍රකරන අවස්ථාපිත සාධකයන්, වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාර්ක් සම්මුතියේ දක්වා ඇති ආකාරයට කාන්තාවන් සහ ළමයින් වෙළදම් කිරීමට එරෙහි සටන් කිරීම පිණිස විශේෂ පියවරයන් ගැනීමට අවශ්‍ය විධිවිධාන සපයනු ලබයි.

**දකුණු ආසියාවේ ළමා සුබසාධනය ප්‍රවර්ධනය කිරීම පිණිස කලාපීය විධිවිධාන සකස් කිරීම පිළිබඳ වන සාර්ක් සම්මුතිය**

මෙම සම්මුතිය කලාපයේ සිටින ළමයින්ගේ සුබසාධනය ඉහල නැංවීම සඳහා වන කැපවීමකි. මෙම සම්මුතියේ IVව්‍යවස්ථාවේ, 3 (අ) ඡේදය මඟින් තැනැත්තන් වෙළදාම් කිරීමෙන් ළමයින් ආරක්ෂා කිරීම සඳහා අවශය වන නෛතික හා පරිපාලනමය යාන්ත්‍රණයන් සහ සමාජ ආරක්ෂණ ජාලයක් පවත්නා බවට තහවුරු කිරීම රාජ්‍ය පාර්ශවයන්ගෙන් අපේක්ෂා කරනු ලබයි.

## 4.13 තැනැත්තන් වෙළදාම් කිරීමට අදාල සෙසු කලාපීය ලේඛන

**සම්මුතීන්**

| |
|---|
| **අ. අප්‍රිකානු කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු මානව සහ පුද්ගල අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට සබැඳි සංධානය** |
| මෙහි 4 වන ව්‍යවස්ථාව මගින් දක්වන්නේ කාන්තාවන්, තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්කිරීම වැළැක්වීමට සහ හෙළාදැකීම පිණිස, එකී වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීමට සහ අවධානමෙ සිටින කාන්තාවන් ආරක්ෂා කිරීම පිණිස පාර්ශවකාර රාජ්‍යයන් විසින් සුදුසු සහ ඵලදායී පියවරයන් ගත යුතු බවයි. |
| **ආ. මානව හිමිකම් පිළිබඳ ඇමරිකානු සම්මුතිය** |
| වහල්භාවයෙන් නිදහස යන මාතෘකාවෙන් යුතු 6 වන ව්‍යවස්ථාව දක්වන්නේ<br>(1) කිසිදු තැනැත්තකු වහල්භාවයේ හෝ, වහල් වෙළදාම් සහ කාන්තාවන් වෙළදාම් කිරීම වැනි සියලු ම ආකාරයේ ක්‍රමවලින් තහනම් කළ ස්වේච්ඡා නොවන පරවශතාවයට යටත් නොකළ යුතු ය.<br>(2) කිසිදු තැනැත්තකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් සේවයේ යෙදීමට යටත් නොකල යුතු ය. |
| **ඇ. 2004 මානව හිමිකම් පිළිබඳ අරාබි ප්‍රඥප්තිය** |
| ප්‍රඥප්තිය සඳහන් කරනු ලබන්නේ<br>(1) සියලු ම ආකාරයේ වහල්භාවයන් සහ තැනැත්තන් වෙළදාම් කිරීම් තහනම් වන අතර නීතියෙන් දඬුවම් කළ හැකි ය. කිසිදු පුද්ගලයකු කිසිදු අවස්ථාපිත සාධකයක් මත වහල්භාවයේ හෝ පරවශතාවයේ රඳවා තබා ගත නොහැකි ය.<br>(2) බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, වෛශ්‍යා වෘත්තියේ යෙදවීම හෝ ලිංගික සූරාකෑමක් සඳහා තැනැත්තන් වෙළදාම් කිරීම, වෙනත් අයෙකු වෛශ්‍ය වෘත්තියේ යොදවා සූරාකෑම හෝ වෙනත් යම් ආකාරයකින් සූරාකෑම, හෝ සන්නද්ධ අරගලයන් තුළ දී ළමයින් සූරාකෑමට ලක් කිරීම තහනම් වේ. |
| **ඈ. 2005 තැනැත්තන් වෙළදාම් කිරීමට එරෙහි ක්‍රියාවන් පිළිබඳ යුරෝපානු කවුන්සිලයේ සම්මුතිය** |
| මෙම සම්මුතිය තැනැත්තන් වෙළදාම් කිරිම වැළැක්වීම, වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වරදකරුවන්ට නඩු පැවරීම යන ප්‍රධාන අරමුණු තුන මත පදනම් වී තිබේ. |
| **ඉ. 1999 ළමා අයිතිවාසිකම් සහ සුභසාධනය පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය** |
| මෙම ප්‍රඥප්තියේ 29 වන ව්‍යවස්ථාව පහත දෑ වැළැක්වීමට රාජ්‍ය පාර්ශවයන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව සඳහන් කරයි:<br>(අ) දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් ඇතුළු කවර හෝ තැනැත්තකු විසින්, කවර වූ අරමුණකට හෝ කවර වු හෝ ආකාරයකින්, ළමයින් පැහැරගෙන යෑම, විකිණීම හෝ ළමයින් තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්කිරීම.<br>(ආ) සියලු ම ආකාරයේ සිඟමන් යැදීම් සඳහා ළමයින් යොදා ගැනීම |

**ප්‍රකාශනයන්**

a. තැනැත්තන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමයින් වෙළදාම් කිරීමට එරෙහි ආසියාන් (ASEAN) ප්‍රකාශනය - 2004

*b.* අවිධිමත් හෝ ලේඛනගත නොවන සංක්‍රමණ පිළිබඳ බැංකොක් ප්‍රකාශනය - 1999

*c.* තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම සම්බන්ධ බ්‍රසල්ස් ප්‍රකාශනය -2002

d. තැනැත්තන් වෙළදාම් කිරීමට එරෙහිව සටන් කිරීම පිළිබඳ බටහිර අප්‍රිකානු රාජ්‍ය ආර්ථික ප්‍රජාවේ ප්‍රකාශනය - 2001

e. කලාපීය ආරක්ෂාව පිළිබඳ නසොනිනි ප්‍රකාශනය-2002 (පැසිපික් දිවයින් සමුළුව) 2002

## පස්වැනි මොඩියුලය

| දේශීය නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව | | |
|---|---|---|
|  | දේශන පැය ගණන | 2 |
|  | ඇගයීම් ක්‍රමවේදය | පන්ති කාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මොඩියුලය අවසානයේ දී ශිෂ්‍යයන් හට,<br>• ළමුන් වෙළෙඳාම් කිරීම පිළිබඳ අදාළ දේශීය ප්‍රතිපත්ති  සහ නීතින් සම්බන්ධව අවබෝධය ලබාගැනීමට;<br>• කාර්යපටිපාටික නීතිය සහ  එහි භාවිතය පිළිබඳ අවබෝධය ලබාගැනීමට;<br>• වින්දිතයන් වෙත පවතින ප්‍රතිකර්ම පිළිබඳ අවබෝධය ලබාගැනීමට හැකියාව හිමි වේ. |

### 5.1 ළමුන් වෙළෙඳාම් කිරීම සම්බන්ධ දේශීය නීති සහ ප්‍රතිපත්ති

#### ජාතික ප්‍රතිපත්තිය

| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් තුළ නීති පැනවීම සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ මූලධර්ම දක්වයි. මෙම මූලධර්ම රාජ්‍යය මත ප්‍රමිතීන් ඇති කිරීම සහ ප්‍රතිජානන යුතුකම් නියම කිරීම සිදුකරනු ලැබුව ද ඒවාට නීතිමය බලාත්මකභාවයක් ලබාදිය නොහැක.[58] දරුවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහෝ ප්‍රතිපත්ති හා යුතුකම් යොදා ගත හැකිය.<br>27(13) ව්‍යවස්ථාවෙහි විශේෂයෙන් දක්වන පරිදි, ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන් සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජයික  වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට සහතික කිරීමටත්, ඔවුන් සූරාකෑම පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ ශුභ සිද්ධිය රාජ්‍යය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව ප්‍රවර්ධනය කළ යුත්තේ ය. |
| **මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම** (2017-2021) |
| 2017-2021 වසර සඳහා සකස් කරන ලද මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) මානව හිමිකම් ක්ෂේත්‍රයේ ඉලක්කගත ක්‍රියාකාරකම් ලේඛනගත කරන අතර,  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය; නීතිමය;  ප්‍රතිපත්තිමය;  සහ පරිපාලනමය රාමු තුළින් මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික ක්‍රියාදාමයන් සහ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම අරමුණු කරයි.<br>මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) තේමාගත පරිච්ඡේද 10කින් සමන්විත වන අතර, ඉන් එක් පරිච්ඡේදයක් ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ වෙන් කර ඇත. එම පරිච්ඡේදයෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ නැවත සමාජගත කිරීමේ සේවා ඇතුළත් අයිතිවාසිකම් පදනම් කරගත් ළමා ආරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීමයි. ජාවාරමට ගොදුරු වූවන්ට සහන සැලසීම සහතික කිරීම සඳහා ද මෙම සැලැස්ම විසින් රජය වෙත නියම කරයි. |

[58] 29 වන ව්‍යවස්ථාව

## ළමයින් වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා පවතින අනෙකුත් ප්‍රතිපත්තීන්

ළමයින් වෙළෙඳාම් කිරීමට එරෙහිව පියවර ගැනීම සඳහා ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017 සැප්තැම්බර් මස ජාතික මට්ටමින් දියත් කරන ලදී.

මෙම වැඩසටහන ඕස්ට්‍රේලියානු රජයේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් වූ අතර එය අන්තර්ජාතික සංක්‍රමණ පිළිබඳ සංවිධානය සමඟ එක්ව අධිකරණ අමාත්‍යංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක කොටසකි. රූපවාහිනී දැන්වීම් හරහා සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය නිලධාරීන් මෙන්ම ප්‍රජාමූල සංවිධාන හරහා ජනාතව ද දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

### කාන්තා ප්‍රඥප්තිය

කාන්තා ප්‍රඥප්තිය 1993 මාර්තු මාසයේ දී සම්මත විය. මෙම ප්‍රඥප්තිය මඟින්, රාජ්‍යය විසින්, කාන්තාවන්ගේ පූර්ණ සංවර්ධනය හා අභිවර්ධනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා ප්‍රඥාපනය කිරීම ඇතුළු, විශේෂයෙන් ම දේශපාලන, සාමාජීය, ආර්ථීක සහ සංස්කෘතික යන සියලු ම ක්ෂේත්‍රවල එනම්, කාන්තාවන්ට පුරුෂයන් හා සමාන පදනමක් මත මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ක්‍රියාත්මක කිරීම හා භුක්ති විඳිම සහතික කරලීමේ කාර්යය සඳහා උචිත සියලු පියවර ගත යුතු බව දක්වයි.

### ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය

1992 දී සම්මත කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අන්තර්ජාතික මානව හිමිකම් පිළිබඳ සම්මුතින්හි පිළිගත් අයිතිවාසිකම් නැවත අවධාරණය කරන අතර, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම කෙරෙහි දරුවන් කේන්ද්‍රගත වූ වැඩපිළිවෙලක් වෙත අවධානය යොමු කිරීම අනුමත කරයි. ඒ අනුව, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මඟින්, *'ළමයින්ගේ සහ තරුණයන්ගේ ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික සහ සමාජීය වශයෙන් පූර්ණ වර්ධනය සහතික කරනු පිණිස සහ සූරාකෑමෙන් සහ වෙනස්කම් දැක්වීමෙන් ඔවුන් ආරක්ෂා කරනු පිණිස රජය විසින් ළමයින්ගේ සහ තරුණයන්ගේ යහපත විශේෂ සැළකිල්ලකින් ප්‍රවර්ධනය කළ යුතු බවට අවධාරණය කරයි.'*

ප්‍රඥප්තියේ 33 වන ව්‍යවස්ථාව අනුව මද්‍යසාර, දුම්කොළ සහ දුම්කොළ නිෂ්පාදනවලින් ළමයින් ඈත් කිරීමට ව්‍යවස්ථාමය, පරිපාලන, සමාජ, සහ අධ්‍යාපන ක්‍රියාමාර්ග ඇතුළු සියළු උචිත ක්‍රියාමාර්ග රාජ්‍යය විසින් ගත යුතු බවට වගකීමක් පනවයි.

ප්‍රඥප්තියේ 3 වන ව්‍යවස්ථාව අනුව, **'දරුවාගේ උපරිම යහපත'** යන මූලධර්මයෙහි ඇති වටිනාකම හඳුනාගනිමින් ඒ පිළිබඳ දැඩි ලෙස අවධාරණය කරයි.

## දණ්ඩනීති සංග්‍රහය

ශ්‍රී ලංකාවේ අපරාධ නීතියේ මූලික හරයාත්මක නීතිය වන්නේ දණ්ඩනීති සංග්‍රහයයි.[59] 2018 ට පෙර වයස අවුරුදු 8 ට අඩු දරුවන් සියලු සාපරාධි වගකීම්වලින් නිදහස් වූ අතර මෑතකාලීනව දණ්ඩ නීති සංග්‍රහයට ගෙන ආ සංශෝධනය අනුව සාපරාධී වගකීම පැවරීමේ අවම වයස් සීමාව වයස අවුරුදු 12 ලෙස ඉහළ නංවන කරන ලදී.[60] එමෙන් ම, යම් අවස්ථාවක දී තමාගේ හැසිරීමේ ස්වභාවය හා එහි ප්‍රතිඵල නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොලත් වයස අවුරුදු 12 කට වැඩි 14 කට අඩු ළමයකු කරනු ලබන කිසිවක් වරදක් නොවන බව දණ්ඩනීති සංග්‍රහය පිළිගනු ලබයි.[61]

1995 දී සහ 2006 දී දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දුන් සංශෝධනවලට පෙර ළමයින් වෙළෙඳාම් කිරීමේ වරද: ස්ත්‍රී සැපයුම (1995 සංශෝධනයෙන් පසුව 'කුට්ටනය' යන වරද හඳුන්වාදෙනු ලැබීය)[62], අස්වාභාවික වැරදි[63], අපහරණය[64], පැහැරගෙන යාම[65], විවාහ වීමට බල කිරීම සඳහා කාන්තාවක් පැහැර ගැනීම[66] සහ වහල්භාවය[67] සම්බන්ධ පොදු ප්‍රතිපාදන මගින් ආවරණය විය.

එමෙන්ම, දණ්ඩනීති සංග්‍රහයේ සඳහන් අනෙකුත් ප්‍රතිපාදන වන: ස්ත්‍රී දූෂණය[68], අඩන්තේට්ටම් කිරීම[69], බලහත්කාරය[70], අසැබි පොත් ආදිය විකිණීම සහ බෙදාහැරීම[71] යන වැරදි ද මෙම ප්‍රතිපාදනවලට අතිරේකව හඳුනාගත හැක.
ගණිකා වෘත්තිය ඇතුළු සියලු ආකාරයේ සූරාකෑම් සඳහා පුද්ගලයින්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීමට එරෙහිව පිළියම් යෙදීම සඳහා 1995 දී[72] සහ 1998 දී[73]දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දුන් සංශෝධන හරහා වැදගත් නෛතික ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී'.
තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද නිශ්චිතව දක්වනු ලබන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 360(ඇ) වගන්තිය තුළ ය. එම වගන්තියේ පැවති අපැහැදිලිතාවයන් හේතුවෙන් 2006 වසරේ දී එය දණ්ඩනීති සංග්‍රහයෙන් ඉවත් කර, පැලර්මෝ සංධානය සහ අනෙකුත් මානව හිමිකම් සම්මුති යටතේ ඇති වගකීම් අවධාරණය කරමින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම පිළිබඳ නව ප්‍රතිපාදනයක් හඳුන්වාදෙන ලදී.[74]

[59] 1883 අංක 02 දරන ෘ සංශෝදිත*
[60] 75 වගන්තිය :2018 අංක 10 පනතින් සංශෝධිත*
[61] 76වගන්තිය :2018 අංක 10 පනතින් සංශෝධිත*
[62] 360(අ) වගන්තිය
[63] 365 වගන්තිය
[64] 350, 351, 352 වගන්ති
[65] 353 වගන්තිය
[66] 357 වගන්තිය
[67]361 වගන්තිය
[68]363 වගන්තිය
[69]342 වගන්තිය
[70]340 වගන්තිය
[71]285 වගන්තිය
[72]1995 අංක 22 දරන (සංශෝධන) පනත
[73]1998 අංක 29 දරන (සංශෝධන) පනත
[74]දණ්ඩනීති සංග්‍රහයේ තැනැත්තන් වෙළෙඳාම් කිරීම පිළිබඳ පැවති එකම පොදු විධිවිධානය වූයේ 360 ඇ.(1) (අ) වගන්තියයි. එය මුදල් හෝ වෙනත් සලකා බැලීමක් සඳහා පුද්ගලයන් මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම පිළිබඳව දක්වන ලදී. මෙම ක්‍රියාවන් සිදු කරනුයේ කුමන අරමුණක් සඳහා ද යන්න නිශ්චිතව දක්වා නොමැති වූ හෙයින්, පුළුල් පරාසයකට මෙම වගන්තිය අදාළ කිරීමට හැකි විය. මේ අනුව, මෙම කොටස පැහැදිලිව කියවීමෙන් පෙනී යන්නේ විවාහය, දරුකමට හදා ගැනීම, සූරාකෑමක් හෝ ජාවාරමක් ලෙස වෙනත් ඕනෑම කරුණක් සඳහා පුද්ගලයන් මිලදී ගැනීම හෝ හුවමාරු කිරීම 'තැනැත්තන් වෙළෙඳාම් කිරීම' යටතේ ආවරණය වන බවයි. කෙසේ වෙතත්, 360 ඇ (1) (ආ) වගන්තිය ස්වාධීනව කියැවිය හැකිද යන්න සම්බන්ධයෙන් ව්‍යාකූලතාවයක් ඇති වූ අතර, එය360 ඇ. වගන්තියේ (i) සිට (vi) දක්වා ඇති නීති විරෝධි දරුකමට හදාගැනීම පිළිබඳ ප්‍රතිපාදන සමඟ එක්ව කියවිය යුතු ද යන්න ප්‍රශ්නගත විය. පොදු එකඟතාවය වූයේ 360 ඇ (1) ආ වගන්තිය 360 ඇ (i) සිට (vi) දක්වා වගන්ති සමඟ එක්ව කියවිය යුතු බවයි. - *ළමයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - 2002 අප්‍රේල්*

## 5.2. ළමුන් ද ඇතුලත්ව තැනැත්තන් වෙළෙඳාම් කිරිම

### 5.2.1. 2006 අංක 16 දරන දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත - 360(ඇ) (1) වගන්තිය

(අ) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් තැනැත්තකු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන නැතහොත් මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරු කිරීමට වෙනත් තැනැත්තකු පොළඹවන නැතහොත් යම් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන;

(ආ) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබාගැනීමේ, වහල්භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදාගැනීමේ කාර්ය සඳහා තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම් තැනැත්තකු බඳවාගන්නා, ප්‍රවාහනය කරන, ස්ථානමාරු කරන, ආරක්ෂාව සලසා දෙන, භාරගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදුකරන හෝ;

(ඇ) යම් ළමයකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමේ හෝ සේවය ලබාගැනීමේ, එම ළමයා වහල්භාවයේ යෙදවීමේ පරවශතාවය හෝ ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා. ප්‍රවාහනය කරන, මාරු කරන, එම ළමයාට ආරක්ෂාව සලසා දෙන හෝ ළමයා භාර ගන්නා හෝ වෙනත් යම් නීතියක් යටතේ වරදක් වන ක්‍රියාවක් සිදු කරන තැනැත්තකු තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදුකරයි,

කවර හෝ තැනැත්තකු තැනත්තන් වෙළෙඳාම් කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

**ඔබ දැන සිටියා ද?**

තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තෙක් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකිය; තවද ළමයකු සම්බන්ධයෙන් එම වරද සිදු කරනු ලබන අවස්ථාවක එම තැනැත්තා අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය.

**උක්ත වගන්තිය මගින් පහත යෙදුම් සම්බන්ධව සමාන අර්ථ නිරූපණ සපයනු ලබයි:**

- **බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩගැනීම යන්නට 358(අ) වගන්තිය සමාන අර්ථ දක්වයි.**
- **වහල්භාවයට පත් කිරීම යන්නට 358(අ) වගන්තිය තුළ සමාන අර්ථ දක්වයි.**
- **පහසුවෙන් අවදානමට ලක්විය හැකි තැනත්තන් සූරාකෑම, එවැනි පුද්ගලයෙකුගේ ආර්ථික, සංස්කෘතික හෝ වෙනත් තත්ත්වයන්ගෙන් ප්‍රයෝජන ගනිමින් ඕනෑම ක්‍රියාවකට යටත් වීමට පුද්ගලයෙකුට බල කිරීම යන්නට ද සමාන අර්ථ දක්වයි.**

| 360(ඇ) (1) වගන්තිය | |
|---|---|

(අ) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් තැනැත්තකු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන නැතහොත් මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරු කිරීමට වෙනත් තැනැත්තකු පොළඹවන නැතහොත් යම් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන තැනැත්තෙකු විසින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදු කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයනය 1**

රාණිට කොළඹ ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් ලබා දෙන බවට නියෝජිතයකු පොරොන්දු වී ඇත. ඇය කොළඹට පැමිණි විට එම තැනැත්තා විසින් රාණි වෙනත් පුද්ගලයෙකුට විකුණයි. රාණි කොළඹ ගණිකා නිවාසයක රඳවාතබා ඇත.

(ආ) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබාගැනීමේ, වහල්භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නිතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදාගැනීමේ කාර්ය සඳහා තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම් තැනැත්තකු බඳවාගන්නා, ප්‍රවාහනය කරන, ස්ථානමාරු කරන, ආරක්ෂාව සලසා දෙන, භාරගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදුකරන හෝ තැනැත්තෙකු විසින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදු කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයනය 2**

සීතා ඉතා දුප්පත් තැනැත්තියක් වන අතර ඇය සාප්පු හිමියෙකුට ණය වී සිටී. සාප්පු පාලකයා ඇයව පොලිසියට වාර්තා කරන බවට තර්ජනය කර ණය ගෙවන තුරු කිසිදු වැටුපක් හෝ විවේකයක් නොමැතිව වැඩ කිරීමට ඇයට බල කරයි.

(ඇ) යම් ළමයකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමේ හෝ සේවය ලබාගැනීමේ, එම ළමයා වහල්භාවයේ යෙදවීමේ පරවශතාවය හෝ ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා. ප්‍රවාහනය කරන, මාරු කරන, එම ළමයාට ආරක්ෂාව සලසා දෙන හෝ ළමයා භාර ගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන තැනැත්තෙකු විසින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදු කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයනය 3**

වයස අවුරුදු 16 දී සුනිල් නිවසින් පැන ගියේ නිවසේ ඇති වූ අයහපත් තත්ත්වය හේතුවෙනි. ප්‍රදේශයේ රැකියා ඒජන්සියක් ඔහුට අවන්හලක අර්ධකාලීන රැකියාවක්, නවාතැන් හා ආහාර ලබා දුන් අතර ඔහුට උදේ පාසලට යා හැකි බවට පොරොන්දු විය. සුනිල් ඊට එකඟ විය. ඔහු පැමිණි විට ඔහුට සතියේ දින 7ම වැඩිපුර පැය ගණනක් වැඩ කිරීමට සිදු වූ අතර ආහාර ලබාදුන්නේ අවම වශයෙන් ය. ඔහුට පාසැල් යාමට අවසර නොලැබුණි. ඔහු පැමිණිලි කළහොත් හෝ විවේක ගත් විට පහර දී වාචිකව අපයෝජනය කරනු ලැබීය. රාත්‍රියේ ඔහු කාමරයක සිර කර තබා තිබූ අතර ඔහුට කිසි තැනකට යාමට ඉඩ නොදුනි. ඔහු පලා යාමට උත්සාහ කළහොත් ඔහුව පොලිසියට වාර්තා කරන බවට ඔහුගේ සේවායෝජකයා තර්ජනය කළේ ය.

*ඔබ දැන සිටියාද?*

**වෙළෙඳාමට ගොදුරු වන තැනැත්තා දරුවකු වන විට, එම දරුවාගේ කැමැත්ත එහිදී වැදගත් නොවන බව.**

2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත; **(SAARC)** අනුව ළමයින් වෙළෙඳාමේ යෙදීම යන යෙදුම පුළුල් ලෙස අර්ථනිරූපය කර ඇත. දණ්ඩ නීති සංග්‍රයේ මෙන්ම පැලර්මෝ සංධානයේ ද තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන්න අර්ථනිරූපණය තුළට ඇතුළත් නොවන ක්‍රියාවන් මෙම පනතෙහි ඇතුලත් වේ. මෙම පනත යටතේ ඕනෑම පුද්ගලයෙකු මිලට ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම වැනි, පුද්ගලයෙකු වෙළෙඳාම් කිරීමේ මාධ්‍යයන් පුළුල් ලෙස විග්‍රහ කරයි. මෙහිදී සූරාකෑම යන්නෙහි අරමුණ ද වඩාත් පුළුල් ලෙස විග්‍රහ කරනු ලබයි. නිදසුනක් වශයෙන් බලය අයුතු ලෙස භාවිතය හෝ අවදානම් සහගත තත්ත්වයි යන්න මිනිස් ජාවාරම් කිරීම හා සම්බන්ධිත ක්‍රියාවක් සිදුවීමට හේතුවන ක්‍රමයක් බවට වගන්තිය තුළ අන්තර්ගත කර නැත. තවද විවාහය සඳහා ළමයින් ප්‍රවාහනය කිරීම පැහැදිලිව ම ආවරණය නොකළ ද, එම වරදෙහි අර්ථ දැක්වීම තුළ අනිවාර්ය වැඩගැනීම හෝ සේවා ලබාගැනීම, වහල්භාවය, පරවශ්‍යතා හෝ වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම් වැනි ක්‍රියාවන් ආවරණය කරනු ලබයි.

### 5.2.2. 2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත[75](*SAARC*- සාක් සම්මුතිය)

පුද්ගල ජාවාරම මැඩපැවැත්වීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධනවලට අමතරව, සාර්ක් සම්මුතිය යටතේ ඇති වගකීම් ඉටු කිරීම සඳහා 2005 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා රජය විසින් මෙම පනත සම්මත කරන ලදී.

**2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත**

කාන්තාවන් සහ ළමුන් ජාවාරම වැළැක්වීම, වෙළඳාමට ගොදුරු වූ තැනැත්තන් උද්ධරණය සහ පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සලසයි.

තවද, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත[76] යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් සහ පොදුරාජ්‍ය මණ්ඩලීය නොවන රටවල් සමඟ රජය විසින් ගිවිසුම්වලට එළඹ ඇති අතර, දේශසීමා අතර සිදුවන ජාවාරම් පිළිබඳ විමර්ශනය සහ නඩු පැවරීමේ දී එය ශක්තිමත් සාධකයකි..

**පනත මඟින් පහත සඳහන් විධිවිධාන සපයයි:**

ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් වෙළෙඳාම් කිරීමේ වරද පනත අර්ථ දක්වන්නේ පහත පරිදි ය:

- *ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් හා ළමුන් වෙළෙඳාම් කිරීම හෝ ඊට සම්බන්ධ ඕනෑම කාරණයක් සඳහා*
- *මූල්‍යමය කටයුතුවල නියැලී සිටින, දැනුවත්ව ඉඩ දෙන හෝ කුලියට දෙන, දැනුවත්ව මුදල් නඩත්තු කරන, හෝ කළමනාකරණය කරන*
- *ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් නඩත්තු කරන*

*ඕනෑම පුද්ගලයෙක් ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් හා ළමුන් වෙළෙඳාම් කිරීමේ වරදට වරදකරු වේ* ඉහත සඳහන් දේ කිරීමට තැත් කරන, ආධාර කරන හෝ අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කරන ඕනෑම පුද්ගලයෙකු ද එම වරද ම සිදුකරයි. එවැනි තැනැත්තෙකු අවම වසර 3ක සහ උපරිමය වසර 15ක අනිවාර්ය සිරදඬුවමකට සහ දඩයකට යටත් විය යුතු ය.

**මිනිස් ජාවාරමට ගොදුරු වුවන්ට අයිතිවාසිකම් ඇති බව ඔබ දැන සිටියාද?**

[75] 2005 අංක 30 දරන
[76] 2002 අංක 25 දරන

a) ජාවාරමට ගොදුරු වූ තැනැත්තාට වන්දි ගෙවීම සඳහා ද මෙම පනත මඟින් විධිවිධාන සලසා ඇති අතර වන්දි ගෙවීමට අපොහොසත් වන්නේ නම් වැරදිකරුට තවත් වසර 5 ක අමතර සිරදඬුවම් නියම කිරීමේ හැකියාව පවතී.

b) වරද සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින දේශීය මෙන්ම විදේශීය තැනැත්තන්ට එරෙහිව නඩු විභාග කිරීමේ බලය මහාධිකරණයට ලබා දී ඇත.

c) සාර්ක් සම්මුතියේ දක්වා ඇති පරිදි ජාවාරම්වලට ගොදුරු වූවන්ගේ අයිතිවාසිකම් සහ ගණිකා වෘත්තියේ යෙදවීම සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා ගත යුතු විශේෂ ක්‍රියාමාර්ග මෙම පනතින් තවදුරටත් දක්වයි.



**<u>ඉගෙනුම් මෙවලම්</u>**

**අභ්‍යාසය**

1. 360(ඇ) වගන්තියේ තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරදේ අංගයන් මොනවද යන්න සහ ඒවායේ අදාළත්වය පිළිබඳ ඔබට ලබා දී ඇති සිද්ධියේ/නඩුවේ සිද්ධිමය සාධක සමග සාකච්ඡා කරන්න.
2. ඔබ සතුව ඇති ඕනෑම සිද්ධියක් ආශ්‍රයෙන් සිද්ධි අධ්‍යයනයක් සකස් කරන්න.
3. තැනැත්තන් වෙළෙඳාම් කිරීම සහ කුට්ටනය යන වරදවල් අතර පවතින සමානතා සහ වෙනස්කම් සාකච්ඡා කරන්න.

4. මිනිස් වෙළඳාමට පහත සඳහන් දේ අතුරින් අදාල වන්නේ මොනවාද?[77]

| | |
|---|---|
| 1. අන්තර්ජාතික දේශසීමා නිත්‍යානුකූල ලෙස තරණය කිරීම | |
| 2. අන්තර්ජාතික දේශසීමා නිත්‍යානුකූල නොවන ලෙස තරණය කිරීම | |
| 3. ප්‍රවාහන වියදම් පියවන තුරු ශ්‍රමිකයන් විසින් වැටුප් රහිතව වැඩ කිරීම | |
| 4. විදේශ ගමන් බලපත්‍රය හෝ හැඳුනුම්පත් ලබා ගැනීම | |
| 5. ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනය | |
| 6. අභ්‍යන්තර සංක්‍රමණ | |
| 7. වහල්භාවය | |
| 8. විදේශගතව ස්වේච්ඡාවෙන් ම ලිංගික සේවා සැපයීම | |
| 9. සිරගත කිරීම | |
| 10. හුදකලා කිරීම | |

5. මිනිස් ජාවාරම පිළිබඳ පැලර්මෝ සංධානයේ අර්ථ දැක්වීමේ ඇති සියලු ම පද රවුම් කරන්න:[78]

'ලිංගික සූරාකෑම', 'අපහරණය', 'අඩන්තේට්ටම් කිරීම', 'ණයගැතිභාවය', 'බියගැන්වීම', 'අවදානම්සහගත තත්ත්වය', 'ව්‍යාජ විශ්වාසය', 'සංවිධානාත්මක අපරාධ', 'පරවශතා', 'වහල්භාවය', 'වරාය', 'ජාවාරම', 'ගණිකා වෘත්තිය', 'ශ්‍රමය සූරාකෑම', 'නූතන වහල් සේවය', 'ළමා කාමුක දර්ශන', 'අවයව ඉවත් කිරීම', 'ප්‍රවාහනය', 'බියගැන්වීම', 'වංචාව', 'බඳවා ගැනීම', 'දේශසීමා තරණය', 'හුවමාරුව', 'බලය භාවිතා කිරීම', 'බලය අවභාවිතය'

[77] Trafficking training Modules (International Organization for Migration Management, 7 Hill Street, Dublin < http://iomireland.ie/wp-content/uploads/2016/04/Train-the-Trainer-Manual-Original.pdf>

[78] එම.

### 5.2.3. තැනැත්තන් වෙළෙඳාම් කිරීම සම්බන්ධව දණ්ඩ නීති සංග්‍රහයේ වෙනත් විධිවිධාන

| වගන්තිය | වරදේ ස්වභාවය | දණ්ඩනය |
|---|---|---|
| 286 අ(1)<br>**ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම් ප්‍රදර්ශනය ආදිය**<br> | (අ) යම් අසභ්‍ය හෝ අශ්ශීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ, යම් අසභ්‍ය හෝ අශ්ශීල ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, එහි නිරූපණයක් කිරීමට හෝ පෙනී සිටීමට යම් ළමයකු කුලියට ගන්නා හෝ සේවයෙහි නියුක්ත කරන, එහිලා උපකාර කරන, ඒ සඳහා කැමති කරවගන්නා, යොදවන, පොළඹවන, හෝ බලකරන, හෝ එවැනි ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් විකුණන හෝ බෙදාහරින නැතහොත් අන්‍යාකාරයකින් පළ කරන හෝ තමා සන්තකයෙහි තබාගන්නා කවර හෝ තැනැත්තකු, හෝ<br><br>(ආ) ළමයෙකුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු, භාරකරුවකු හෝ ඒ ළමයාගේ භාරකාරත්වය දරන තැනැත්තෙකුව සිටිමින්, යම් අසභ්‍ය හෝ අශ්ශීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක සේවයෙහි නියුක්ත කිරීමට හෝ එවැන්නකට සහභාගී වීමට හෝ (අ) ඡේදයෙහි සඳහන් අන්දමේ යම් ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, නිරූපණය කිරීමට හෝ පෙනීසිටීමට ඒ ළමයාට සලස්වන හෝ ඉඩ දෙන කවර හෝ තැනැත්තකු, හෝ<br><br>(ඇ)<br>i. ළමයකුගේ යම් අශ්ශීල ඡායාරූපයක් ගනු ලබන හෝ ගනු ලැබීමට උපකාර කරන කවර හෝ තැනත්තකු,<br>ii. එවැනි ඡායාරූපයක් බෙදාහරින හෝ පෙන්වන හෝ එවැනි යම් ඡායාරූපයක් සහිත යම් පළකිරීමක් බෙදාහරින හෝ පෙන්වන කවර හෝ තැනැත්තකු,<br>iii. එවැනි යම් ඡායාරූපයක් හෝ පළකිරීමක් බෙදාහැරීම සඳහා හෝ පෙන්වීම සඳහා තමා සන්තකයේ තබාගෙන සිටින කවර හෝ තැනැත්තකු,<br>iv. එවැනි ඡායාරූපයක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන හෝ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන්නා හෝ ඒ ප්‍රචාරක දැන්වීමෙහි නම් කර ඇති තැනැත්තා එවැනි යම් ඡායාරූපයක් හෝ පළකිරීමක් බෙදාහරින නැතහොත් පෙන්වන තැනැත්තකු හෝ එසේ කිරීමට අදහස් කරන තැනත්තකු ය යන පණිවිඩය දීමට හැකි වන ආකාරයේ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන කවර හෝ තැනැත්තකු,<br><br>ළමයින්ට අදාළව අසභ්‍ය පළ කිරීම් සහ ප්‍රදර්ශනය පිළිබඳ වරද සිදුකරයි | අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු දහය නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැක. |

| | | |
|---|---|---|
| | | |
| **286 අ (2)** | (2) විකාශනය සඳහා තමාට භාරදෙන ලද යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් ළමයකුගේ අසභ්‍ය හෝ අශ්ශීල ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් බව, ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන යම් තැනැත්තකු විසින් සොයාගනු ලැබීමේ දී, ඒ තැනැත්තා විසින් නොපමාව ම ඔහුගේ සන්තකයේ එම ඡායාරූපය හෝ චිත්‍රපටය තිබෙන බව ළඟම පොලිස් ස්ථානය භාර නිලධාරියාට දැන්විය යුතු ය. | වගන්තියේ දැක්වෙන විධිවිධාන කඩකරමින් ක්‍රියාකරන ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන කවර හෝ තැනැත්තක් අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධානාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එම දඬුවම් දෙකෙන් ම හෝ දඬුවම් කළ හැක. |
| | | |
| **286 ආ**<br>**ළමයකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීමට පරිගණක මගින් සේවා සපයන තැනැත්තකුගේ කාර්යය** | (1) පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තකු විසින් ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා එම පරිගණක පහසුකම භාවිතා නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතුය.<br>(2) ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා (1) උප වගන්තියේ සඳහන් යම් පරිගණක පහසුකමක් භාවිත කරනු ලබන බවට තමා දන්නා (1) වන උප වගන්තියේ සඳහන් තැනත්තකු විසින් ආසන්නත ම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරීයා වෙත එම ක්‍රියාවට අදාළව එම කරුණ පිළිබඳව වහාම දැනුම් දී එම ක්‍රියාව සම්බන්ධයෙන් සහ උද්දේශිත වරදකරුගේ අනන්‍යතාවය ද සම්බන්ධයෙන් තමා සතු තොරතුරු එම නිලධාරියා වෙත හෙළි කරනු ලැබිය යුතු ය. | එම වගන්තිවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එම දඬුවම් දෙකට ම හෝ යටත් කළ හැක. |
| | | |
| **286 ඇ**<br>**ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයක් භාවිතා කරන බවට දැනුම් දීමට ඇති කාර්යභාරය** | (1) ළමයකු අපයෝජනය කිරීම සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කරමින් සිටින බවට දැනගැනීමට ලැබෙන එම පරිශ්‍රය භාරව සිටින හෝ එම පරිශ්‍රයට රැකවරණය ලබාදෙන, එය පාලනය කරන හෝ එහි සන්තකය දරන යම් තැනැත්තෙක් එසේ දැනගැනීමට ලැබුණු විට එම කරුණ පිළිබඳව ආසන්නත ම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියා වෙත වහාම දැනුම්දිය යුතු ය. | එම වරදට වරදකරුවකු වූ අයකු අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එම දඬුවම් දෙකට ම හෝ යටත් කළ හැක. |

| | | |
|---|---|---|
| | (2) ළමයකු අපයෝජනය කිරීම සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කරනු ලබන බව ආසන්නත ම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියා වෙත දැනුම් දීම පැහැර හරින යම් තැනැත්තෙකු එම වරදට වරදකරුවකු වන්නේ ය. | |

| | | |
|---|---|---|
| **288**<br>**ළමයින් සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය** | සිඟාකෑමේ හෝ දන් ලැබීමේ හෝ දන් දීමට පෙළඹවීමේ කාර්යය සඳහා (යම් සිංදු කීමේ, ක්‍රීඩා කිරීමේ, රංගනයේ යෙදීමේ, යම් දෙයක් විකිණීමට ඉදිරිපත් කිරීමේ හෝ වෙනත් ආකාරයක ව්‍යාජයක් ඇතත් නැතත්) යම් වීදියක්, ස්ථානයක හෝ තැනක සිටීමට ළමයකුට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙකු මෙම වරද සිදුකරයි. | අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කළ හැක. |
| | | |
| **308 අ**<br>**ළමයින් කෲරත්වයට භාජනය කිරීම**<br> | වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂකත්වය දරාසිටිමින්, ඒ තැනැත්තාට වේදනාවක් හෝ ඔහුගේ සෞඛ්‍යයට හානියක් සිදුවිය හැකි ආකාරයට (ඇස් පෙනීමට හෝ කන් ඇසීමට හෝ ශරීරයේ අවයවයකට හෝ ඉන්ද්‍රියකට සිදුකරන යම් තුවාලයක් හෝ ඇස්පෙනීමෙහි ලා හෝ කන් ඇසීමෙහි ලා සිදු කරන ලද යම් හානියක් හෝ යම් මානසික ව්‍යාකුලතාවයක් ඇතුළුව) ඕනෑකමින් ම ඒ තැනැත්තාට අඩන්තේට්ටම් කරනු ලැබීමට, හිංසා කරනු ලැබීමට නොසලකාහරිනු ලැබීමට හෝ අතරමං කරනු ලැබීමට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙක් ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද සිදු කරයි. | අවුරුදු දෙකකට නොඅඩු අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කළ හැකිය. ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නියම කරනු ලබන වන්දියක් ගෙවන ලෙසට ආඥා කළ හැකි ය. |
| | | |
| **358 අ**<br>**ණය බැඳුම්කරයට හෝ දාසභාවයට පත් කිරීම බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩ ගැනීම වහල්කමට භාජනය කිරීම හෝ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම.** | (අ) යම් තැනැත්තකු ණය බැඳුම්කරයට හෝ දාසභාවයට පත්කරවන හෝ එසේ පත්කරවීමට සලස්වන,<br><br>(ආ) යම් තැනැත්තකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩගැනීමට යටත් කරවන හෝ එසේ යටත් කිරීමට සලස්වන,<br><br>(ඇ) යම් තැනැත්තකු වහල්කමට භාජනය කරවන හෝ එසේ භාජනය කිරීමට සලස්වන, | (අ), (ආ), (ඇ) ඡේද යටතේ වරදකට වරදකරුවකු වන තැනත්තකු අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට ද (අ), (ආ), (ඇ) ඡේද යටතේ ළමයකුට අදාලව |

| | | |
|---|---|---|
|  | (ඈ) සන්නද්ධ අරගලයක යෙදවීම සඳහා යම් ළමයකු යොදාගන්නා හෝ බඳවාගන්නා තැනත්තෙක් මෙම වරදට වරදකරු වේ. | හෝ (ඈ) ඡේදය යටතේ වරදක් සිදු කරන අවස්ථාවක අවුරුදු තිහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාකාරගත කිරීමකට සහ දඩයකට ද යටත් කළ හැක. |

| | | |
|---|---|---|
| **360 ආ (1)**<br>**ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම**<br> | (අ) යම් ළමයකු ලිංගික අපයෝජනය කිරීම සඳහා කවර හෝ ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත් දර්ශනයකට ළමයකු සහභාගී කරවාගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැන ම ඒ ළමයාට ඉඩ දෙන,<br>(ආ) ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වූවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකු කුට්ටනය කරන්නකු,<br>(ඇ) මුද්‍රණ මාර්ගයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම මගින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වූව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකුගේ සේවාදායකයකු වීමට යම් තැනැත්තකු පොළඹවන,<br>(ඈ) ළමයකු කෙරෙහි තමා දරන වගකීම් බලපෑම් හෝ ළමයකු විෂයෙහි තමාට ඇති ඥාති සම්බන්ධතාවය ඒ ළමයා ලිංගික සංසර්ගයේ යෙදවීම හෝ කවර වූවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා කුට්ටනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා,<br>(ඉ) ළමයකු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වූවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා ඒ ළමයා කුට්ටනය කිරීම පිණිස ඒ ළමයාට තර්ජනය කරන හෝ සාහසිකත්වය පාන,<br>(ඊ) යම් ළමයකු ලිංගික සංසර්ගයේ යෙදවීමේ හෝ කවර වූ ආකාරයක ලිංගික අපයෝජනය සඳහා වූ චේතනාවෙන් යුතුව ඒ ළමයාට හෝ ඔහුගේ දෙමව්පියන්ට මුදලින් ප්‍රතිෂ්ඨාවක් භාණ්ඩ හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදෙන,<br>තැනැත්තකු ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද සිදුකරයි. | අවුරුදු පහකට නොඅඩු අවුරුදු විස්සක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කළ හැක. |
| | | |

| | | |
|---|---|---|
| **360 ඈ**<br>**දරුකමට හදාගැනීම සම්බන්ධ වැරදි**<br> | ළමයකු දරුකමට හදාගැනීමේ කාර්යය සඳහා -<br>(i) යම් තැනැත්තකුගේ දෙමාපියන්ගෙන් කෙනෙකුගෙන් හෝ නෛතික භාරකාරයාගේ කැමැත්ත නොමැතිව යම් විදේශ රටකට ගමන් කිරීම සඳහා එම ළමයාට කටයුතු සලස්වා දෙන හෝ ආධාර කරන<br>(ii) යම් ගර්භනී කාන්තාවකගේ නූපන් ළමයා දරුකමට හදාගැනීම සඳහා මුදල්වලට හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා එම ගර්භනී කාන්තාවගේ ලිඛිත හෝ වාචික කැමැත්ත ලබාගන්නා<br>(iii) ළමයින් දැරීමේ කාර්යය සඳහා කාන්තාවක් හෝ අඹුසැමි යුවලක් බඳවා ගන්නා;<br>(iv) උපත් ලියාපදිංචි කිරීම සම්බන්ධ තැනැත්තකු විසින් උපත් ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කරන ලේඛනයක් හෝ එම ලේඛනයේ අන්තර්ගත යම් උප්පැන්න වාර්තා ව්‍යාජ ලෙස වෙනස් කිරීමට අවසර දෙන<br>(v) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා රෝහල්වලින්, කාන්තා නිවාසවලින්, සායනවලින්, ළදරු පාසල්වලින්, දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින්, ළමා මධ්‍යස්ථානවලින් ළමයින් කුට්ටනය කිරීමේ නියැළී සිටින හෝ ළමයාගේ මවට හෝ වෙනත් තැනැත්තකුට තර්ජනය කිරීමෙන් දරුකමට හදාගැනීම සඳහා එම ආයතනයෙන් හෝ මධ්‍යස්ථානයෙන් ළමයා කුට්ටනය කරන<br>(vi) ළමයාගේ මව ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටින හෝ එසේ පෙනී සිටීමට උපකාරී වන මෙම වරදට වරදකරු වේ. | අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් නැතහොත් එම දඬුවම් දෙකට ම යටත් කළ හැක. |
| | | |
| **360 ඉ**<br>**ළමයකු පොළඹවාගැනීමට ඇවිටිලි කිරීම** | ළමයකු ලිංගික අපයෝජනය කිරීම සඳහා<br>(අ) අවුරුදු දහඅටට අඩු තැනැත්තෙක් හෝ<br>(ආ) අවුරුදු දහඅටට අඩු තැනැත්තකු බවට විශ්වාස කරන තැනැත්තකු<br><br>ශ්‍රී ලංකාව තුළ දී හෝ පිටත සිට කවර හෝ ආකාරයකින් පොළඹවා ගැනීමට ඇවිටිලි කරන කවර හෝ තැනැත්තකු ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීමේ වරද සිදු කරයි. | අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට නැතහොත් එම දඬුවම් දෙකට ම යටත් කළ හැක. |
| | | |
| **365 ආ**<br>**බරපතල ලිංගික අපයෝජනය** | (1) ලිංගික තෘප්තිය ලබාගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් පාවිච්චි කිරීමෙන් පහත විස්තරවල ඇතුලත් පරිවේෂණ යටතේ, | බරපතල ලිංගික අපයෝජනය සිදුකරන තැනැත්තකුට අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූද |

| | | |
|---|---|---|
| | (අ) ඒ අනෙක් තැනැත්තාගේ කැමැත්ත නොමැතිව,<br><br>(ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන්, තර්ජනය කිරීමෙන්, හෝ බියගැන්වීමෙන් ඒ අනෙක් තැනැත්තාට මරණ භය හෝ තුවාල සිදුකිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඒ අනෙක් තැනැත්තා නීතිවිරෝධී ලෙස රඳවාගෙන සිටිය දී හෝ ඒ තැනැත්තාගේ කැමැත්ත ලබාගෙන ඇති අවස්ථාවක එසේ ලබාගත් කැමැත්ත ඇතිව<br><br>(ඇ) අනෙක් තැනැත්තා සිහි විකලව සිටිය දී හෝ මද්‍යසාර නැතහොත් මත් ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක ඒ අනෙක් තැනැත්තා සිටිය දී එසේ ලබාගත් කැමැත්ත ඇතිව<br><br>363 වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය යටතේ සංයුක්ත නොවන යම් ක්‍රියාවක් කරන තැනැත්තෙක් බරපතල ලිංගික අපයෝජනය සිදු කරයි. | කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධානාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු අතර වරද සිදු කරන ලද තැනැත්තා වෙනුවෙන් අධිකරණය නියම කරන ලද වන්දි මුදලක් ගෙවීමට ආඥා කළ හැකි ය.<br>වයස් අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙකුට බරපතල ලිංගික අපයෝජනය සිදු කරන අයකු අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධානාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු අතර වරද සිදු කරන ලද තැනැත්තා වෙනුවෙන් අධිකරණය නියම කරන ලද වන්දි මුදලක් ගෙවීමට ආඥා කළ හැකි ය. |
| | | |
| **365 ඈ**<br>**ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම.** | 345, 360(අ), 360(ආ), 363, 364(අ), 365, 365(අ), 365(ආ) වගන්ති යටතේ වූ වරදකට 'ගොදුරු වූ තැනැත්තුගේ' නම හෝ අනන්‍යතාවය හෝ එළිදරව් කරන තැනැත්තකු මෙම වරද සිදු කරයි. | අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධානාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එම දඬුවම් දෙකින් ම දඬුවම් කළ හැක. |

**කුට්ටනය**
**දණ්ඩනීති සංග්‍රහයේ 360(අ) වගන්තිය**

1) කවර වූවද වයසක සිටින පුරුෂ හෝ ස්ත්‍රී යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගණිකාවක් බවට පත් කිරීමට, කුට්ටනය කරන හෝ තැත්තකරන
2) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොටගෙන වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව හැර යාමට කුට්ටනය කිරීම හෝ කුට්ටනය කිරීමට තැත් කරන එකී කාර්යය සඳහා එවැනි යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන,
3) කවර වුව ද වයසක සිටින, යම් තැනැත්තකු අන්‍ය දේශයක ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත් කිරීමේ චේතනාවෙන් (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ඒ තැනැත්තාට ශ්‍රී ලංකාව හැරයාමට කුට්ටනය කිරීමට තැත්තකරන හෝ එවැනි කාර්යයකට යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන,
4) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොට ගෙන වයස අවුරුදු දහසයට අඩු යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ගෙන එන හෝ ගෙන ඒමට තැත් කරන,
5) ගණිකා වෘත්තිය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත්කිරීමට කවර වුව ද වයසක සිටින, යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවේ ඒ තැනැත්තාගේ සුපුරුදු වාසස්ථානය අතැර යාමට කුට්ටනය කරන හෝ තැත්කරන,
6) යම් තැනැත්තකු අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ ලිංගික අපචාරයකට පාත්‍ර කිරීම අරමුණුකොට ගෙන ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ගණිකා නිවාසයක රඳවා ගන්නා,

යම් තැනැත්තකු 'කුට්ටනය' කිරීමේ වරද සිදු කරයි.

*දඬුවම*

කුට්ටනය කිරීමේ වරදට වරදකරුවකු වූ තැනැත්තකු අවුරුදු දෙකකට නොඅඩු අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධානාගාරගත කිරීමකින් හා දඩයකින් දඬුවම් කළ හැකි ය.

### 5.2.4. ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ අනෙකුත් නීතීන්

**1841 අංක 04 දරණ පාදඩ (අයාල) ආඥා පනත**

පාදඩ (අයාල) ආඥා පනත යනු අයාලේ යෑම සාපරාධී වරදක් ලෙස දක්වා ඇති පැරණි නීතියකි.

පහත දැක්වෙන තැනැත්තන් මෙම ආඥා පනත යටතේ අත්අඩංගුවට ගත හැක:

- කෝලාහලකාරී හෝ නොහික්මුණු ලෙස හැසිරෙන පුද්ගලයන්
- තමාට තමා නඩත්තු කිරීමට හැකියාව ඇති නමුත් එසේ කිරීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකාහරින පොදු ස්ථානයක හෝ වීථියක සැරිසරමින් සිඟමන් යදින තැන්තතකු
- පවුලේ සාමාජිකයන් හිඟාකෑමට හෝ යොදවන හෝ පොළඹවන පුද්ගලයින්
- ප්‍රසිද්ධ වීදියක, ස්ථානයක හෝ නිවාඩු නිකේතනයක අශෝභන ලෙස හැසිරෙන ගණිකාවක්
- අයිතිකරුගේ අවසරයකින් තොරව මඩුවක, ඉස්තොප්පුවක යනාදියක නවාතැන් ගන්නා අයකු
- අයිතිකරුගේ අවසරයකින් තොරව නිවසක් හෝ ගොඩනැගිල්ලක් අපවිත්‍ර කරන ඕනෑම පුද්ගලයෙක්
- හිතාමතාම අවිනීත ලෙස හැසිරෙන අයකු

- අසභ්‍ය පින්තූරයක් හෝ මුද්‍රණයක් ඕනෑම පොදු ස්ථානයක ප්‍රදර්ශනය කරන අයකු
- තුවාල නිරාවරණය කිරීමෙන් සහ වෙනත් ආකාරයකින් සිඟමන් ලබා ගැනීමට උත්සාහ කරන අයකු
- ව්‍යාජ මවාපෑම් යටතේ ආධාර එකතු කරන ඕනෑම පුද්ගලයෙක්
- ප්‍රසිද්ධියේ අශෝභන ක්‍රියාවක් සිදු කරන ඕනෑම පුද්ගලයෙක්
- අවසරයකින් තොරව ඕනෑම රජයේ හෝ පෞද්ගලික ස්ථානයක රැඳී සිට හමු වූ පුද්ගලයෙක්
- වෙනත් අයකු සමග ලිංගික සංසර්ගය සඳහා ප්‍රසිද්ධියේ ඇවිටිලි කරන අයකු
- ගණිකා වෘත්තියේ ඉපැයීම් මත ජීවත් වන ඕනෑම තැනැත්තෙක්
- නීති විරෝධී හෝ අස්වාභාවික සංසර්ගය සඳහා සංවිධානාත්මක ලෙස පුද්ගලයින් සම්පාදනය කරන ඕනෑම පුද්ගලයෙක්
- රැඳවුම්භාරයේ සිටින ගැහැනු ළමයකු දූෂණය කරන, වරදට පොළඹවන හෝ එසේ කිරීමට අනුබල දෙන තැනැත්තකු



**පාදඩ (අයාල) ආඥා පනතෙහි ගැහැනු ළමයා යනුවෙන් දක්වා ඇත්තේ වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමයින් ය.**

පාදඩ (අයාල) ආඥා පනත යටතේ ගණිකා වෘත්තිය වැනි ක්‍රියාවන් වෙනුවෙන් දරුවන් යෙදවීම, අනෙක් ආකාරයන්ගේ ලිංගික සූරාකෑම සහ සිඟමන් යැදීමට දරුවන් යොදාගැනීම කරන අයකුට එරෙහිව නඩු පැවරිය හැකි අතර එවැනි ක්‍රියාවන්ගේ වින්දිතයන්ද අත්අඩංගුවට ගැනීමට හැකියාවක් පවතී.

- ප්‍රායෝගිකව මෙම ආඥාපනත බොහෝ විට ළමා ලිංගික ශ්‍රමිකයන් හෝ සිඟමනේ යෙදෙන ළමයින් අත්අඩංගුවට ගැනීම සඳහා යොදා ගනී.
- ඒ හා සමානව වීථියේ අසාමාන්‍ය ලෙස හැසිරෙන දරුවෙකු මෙම පනත යටතේ අත්අඩංගුවට ගත හැකිය.

| 1889 අංක 05 දරන ගණිකා නිවාස ආඥා පනත |
|---|
| **ගණිකා නිවාස ආඥා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව,**<br>අ) ගණිකා නිවාසයක් පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම, ක්‍රියා කිරීම හෝ සහාය දෙන,<br>ආ) කුලී නිවැසියෙකු, බදු ගැනුම්කරු, පදිංචිකරුවෙකු හෝ ඕනෑම පරිශ්‍රයක හිමිකරුවෙකු වී දැනුවත්ව එවැනි පරිශ්‍රයක් ගණිකා නිවාසයක් ලෙස පවත්වාගෙන යාමට හෝ පුරුද්දක් ලෙස ගණිකා වෘත්තියේ යෙදීමට අවසර දෙන,<br>ඇ) පරිශ්‍රයක බදුකරු හෝ ඉඩම් හිමියා වී, හෝ එවැනි බදුකරුගේ හෝ ඉඩම් හිමියාගේ නියෝජිතයා වී, එවැනි පරිශ්‍රයක් හෝ එහි යම් කොටසක් ගණිකා නිවාසයක් ලෙස භාවිතා කිරීමට අවසර දෙන හෝ දැනුවත්ව කැමැත්තෙන් ගණිකා නිවාසයක් ලෙස එවැනි පරිශ්‍රයන් හෝ එහි කොටසක් අඛණ්ඩව භාවිතා කරන,<br>ඕනෑම අයෙක් ගණිකා නිවාස ආඥා පනත යටතේ වැරදිකරුවකු වේ. |
| කෙසේ වෙතත්, එවැනි නීති විරෝධී ක්‍රියාවලට ගොදුරු වූ කාන්තාවන් සහ ළමයින් ගණිකා නිවාස ආඥා පනත යටතේ වරදකරුවන් නොවිය යුතු ය. |

| | |
|---|---|
| 02 වගන්තිය | අ) මෙම පනත යටතේ වැරදිකරු වූ පුද්ගලයෙකුට රුපියල් 500 නොඉක්මවන දඩයක් හෝ අධිකරණයේ අභිමතය පරිදි මාස හයකට නොවැඩි කාලයක් සඳහා ලිහිල් හෝ බරපතල සිර දඬුවමක් හෝ එම දඬුවම් දෙක ම හෝ නියම කළ හැක.<br><br>ආ) දෙවනවර හෝ ඉන්පසුව වරදකරු වන අයකුට රුපියල් 1000 ක දඩයක් හෝ වසර 1 නොඉක්මවන සිර දඬුමක් හෝ ඒ දඬුවම් දෙක ම නියම කල හැක. |
| | ආඥා පනතේ දැඩි දඬුවම් දක්වා නැත. දඩ මුදල් සහ සිර දඬුවම් අවම ඒවා වේ.<br><br>ආඥා පනත යටතේ දක්වා ඇති සියලු වැරදි ඇප දියහැකි ආකාරයේ ඒවා වන අතර අත්අඩංගුවට ගැනීමට වරෙන්තු අවශ්‍ය වේ.<br><br>කෙසේ වෙතත් 2 වන වගන්තිය යටතේ වරද පිළිබඳ අර්ථ දැක්වීම යටතේ හැර ගණිකා නිවාස යන පදය ආඥා පනතේ පැහැදිලිව අර්ථ දක්වා නැත. |
| | |

**කෙසේ වෙතත් දණ්ඩ නීති සංග්‍රහයේ 360 (ආ) (1) (අ) වගන්තිය අනුව, 'යම් ළමයකු ලිංගික අපයෝජනයට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත්, දර්ශනයකට ළමයකු සහභාගී කරවාගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැනම ඒ ළමයාට ඉඩ දෙන,' අයකු ළමයකුගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද සිදු කරයි.**

**ඒ අනුව මෙම වගන්තියේ විග්‍රහ කර ඇති 'පරිශ්‍රය' යන්නට ගණිකා නිවාස ආඥා පනතේ දක්වා ඇති පරිශ්‍රය යන යෙදුමට ආදේශ කළ හැකි අතර වරදකරුවන්ට ගණිකා නිවාස ආඥාපනතට අමතරව දණ්ඩ නීති සංග්‍රහය යටතේ ද නඩු පැවරිය හැක.**

**කාර්ය පටිපාටික නීතිය**

ළමයින් සඳහා වන යුක්ති ක්‍රියාදාමය තුළ අපරාධවලට ගොදුරු වූ දරුවන්ට (සහ සාක්ෂිකරුවන්ට) විශේෂයෙන් අදාළ වන නීති, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණයන් ඇතුළත් වේ.

**1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහ පනත**

දණ්ඩ නීති සංග්‍රහය යටතේ ළමයින් වෙළඳාම් කිරීම සම්බන්ධ විශේෂිත වැරදිවලට අමතරව, ළමා වින්දිතයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ඇතැම් ක්‍රියාදාම මැදිහත්වීම් සිදු කර ඇත. නිදසුනක් ලෙස, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 453අ. වගන්තිය අනුව (1998 අංක 28 දරන පනතින් සංශෝධිත) ළමා අපචාර සම්බන්ධයෙන් වන නඩු කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු ය.

තවද, 1998 අංක 27 දරණ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත අනුව ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16ට අඩු ගැහැණු දරුවකු දූෂණය කිරීම) සම්බන්ධ නඩුවක් විභාග විය යුතු කාර්යපටිපාටිය ලඝු කාර්යපටිපාටිය ලෙස සංශෝධනය කරන ලදී.[79] මෙම සංශෝධනය හරහා නීතිපතිවරයාට සෘජුව ම මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කිරීමට හැකියාව හිමි වූ අතර, එමගින් නඩු කටයුතු කඩිනමින් සිදුකිරීමට පහසුකම් සපයයි.

[79] 1998 අංක 27 දරණ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත -2(1)(ආ)

## 1895 අංක 14 දරන සාක්ෂි ආඥාපනත

1872 ඉන්දීය සාක්ෂි ආඥාපනත අනුව සකස් කරන ලද මෙම ආඥා පනත, යුද්ධාධිකරණය සහ සමථකරුවන් ඉදිරිපිට දී කෙරෙන කටයුතු හැර අන් සියලු අධිකරණ ඉදිරියේ සිදු කරන අධිකරණ කටයුතු සඳහා අදාළ වේ.[80]
සාක්ෂි නීතියේ වඩාත් ම මුල් බැසගත් මූලධර්මවලින් එකක් වන්නේ ප්‍රවාදක සාක්ෂි බැහැර කිරීමේ රීතියයි. ප්‍රවාදක සාක්ෂි බැහැර කිරීමේ රීතියේ හරය වන්නේ, නඩු කටයුතුවල දී වාචික සාක්ෂි දෙන පුද්ගලයෙකු විසින් කරන ලද ප්‍රකාශයක් හැර වෙනත් ප්‍රකාශයක් පිළිගත නොහැකි බවයි. මෙම රීතියේ පදනම වන්නේ ප්‍රවාදක සාක්ෂි විශ්වසනීයත්වයෙන් තොර බවයි.

1995 සහ 1999 සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත් හරහා ප්‍රවාදක සාක්ෂි බැහැර කිරීමේ රීතිය ඉවත් කර ඉලෙක්ට්‍රොනික සහ පරිගණක සාක්ෂි ආවේශ්‍ය කරගැනීමට විධිවිධාන සලසයි. සාක්ෂි ආඥා පනතේ 163අ.(1) වගන්තිය අනුව ළමා අපචාර සම්බන්ධ නඩු කටයුත්තක දී, එම නඩුවේ චූදිතයා නොවන වැඩිහිටියකු ඉදිරිපිට දී නඩුකටයුත්ත සම්බන්ධව එම ළමයා විසින් ලබාදෙන සම්මුඛ සාකච්ඡාවක වීඩියෝ පටිගත කිරීමක් සාක්ෂි වශයෙන් අදාල කරගත හැක.[81] එමඟින් දරුවාගේ සාක්ෂි විවෘත අධිකරණයේ දී මූලික සාක්ෂි විමසීමක් වශයෙන් ප්‍රතිස්ථාපනය කර ඇත. කෙසේ වෙතත්, ඉහත විධිවිධානය අදාළ වන්නේ මූලික සාක්ෂි විමසීමකට පමණක් වන අතර එහිදී දරුවාගෙන් හරස් ප්‍රශ්න විමසීමකට යොමු නොවන හෙයින්, අධිකරණ කටයුතු අතරතුර දී දරුවාට ඇතිවන මානසික කම්පනය අවම කිරීම සඳහා එය හේතු වේ.

## 1939 අංක 48 දරණ ළමා හා යෞවන ආඥා පනත

**මෙම ආඥාපනත මගින් විශේෂිත අධිකරණ පිහිටුවන ලබයි. ආඥා පනත අනුව,**

| **2 වගන්තිය** | **88 වගන්තිය** |
|---|---|
| **බාල වයස්කාර අධිකරණ (ළමා උසාවි) යනු අර්ථ දැක්වෙන්නේ ළමයකු හෝ යෞවනයකු සම්බන්ධව නඩු කටයුතු පවත්වාගෙන යා හැකි අධිකරණයකි.** | ළමයකු යනු වයස අවුරුදු 14 ට අඩු තැනැත්තකු වන අතර යෞවනයකු යනු වයස අවුරුදු 14ට වැඩි 16ට අඩු තැනැත්තකු ය. |

**චෝදනාවට ලක්වූ වරදෙහි ස්වභාවය දරුවාගේ හෝ තරුණයින්ගේ වයස සහ පරිණත මට්ටමට ගැළපෙන භාෂාවෙන් පැහැදිලි කිරීම සඳහා මෙම ආඥා පනත මගින් මහේස්ත්‍රාත්වරයාට නිශ්චිත වගකීමක් පැවරේ.**

**දරුවකු හෝ තරුණයෙකු සමඟ කටයුතු කරන සෑම උසාවියක් ම මූලික වශයෙන් දරුවාගේ සුභසාධනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බවට ද එය නියම කරයි.**

### 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය 1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත හරහා පිහිටවනු ලබයි. මෙම පනත 1994 අංක 04 හා 2009 අංක 56 යන පනත් හරහා සංශෝධනය වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යයංශය යනු විදේශ සේවා නියුක්තිය පිළිබඳ මෙරට පවතින මූලික පාලන අධිකාරියයි.

[80] සාක්ෂි ආඥාපනත - 2(1)
[81] 1999 අංක 32 දරණ සාක්ෂි විශේෂ විධිවිධාන පනත අනුව සංශෝධිත සාක්ෂි ආඥා පනත

කාර්යංශයේ මූලික අරමුණ,

- බඳවාගැනීම් කාර්යපටිපාටිය විධිමත් කිරීම
- විදේශගත සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුබසාධනය තහවුරු කිරීම
- ශ්‍රී ලාංකිකයන්ට වඩාත් යහපත් විදේශ සේවා නියුක්තික අවස්ථා නිර්මාණය කිරීම

| වගන්තිය | වරදේ ස්වභාවය | දණ්ඩනය |
|---|---|---|
| **62 වගන්තිය**<br>**නීති විරොධී බඳවා ගැනීම්** | (1) මෙම පනතේ විධිවිධානවලට අනුකූලව හැර<br><br>(අ) රැකියාවක් සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකුගෙන් කිසියම් මුදලක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වීමට හෝ පිටත්ව යාමට එම පුද්ගලයාට හෝ වෙනත් පුද්ගලයෙකුට සහාය වීමට අදහස් කරන ඕනෑම පුද්ගලයෙකු සමඟ ගිවිසුමක් ඇතිකරගනු ලබන හෝ එසේකිරීමට උත්සාහ කරන අයකු;<br><br>(ආ) රැකියා අරමුණු සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වීමේ හෝ පිටත්ව යාමේ අරමුණු සඳහා ඕනෑම පුද්ගලයෙකුට සංක්‍රමණය වීමට හෝ පිටත්ව යාමට හෝ සංක්‍රමණය වීමට හෝ පිටත්ව යාමට උත්සාහ කිරීමට හෝ උපකාර කිරීම සිදුකරන අයකු මෙම පනත යටතේ වරදකරු විය යුතු ය. | මෙම විධිවිධානය යටතේ වැරදිකරු වූ පුද්ගලයෙකුට රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයකට නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර මාස දොළහකට නොඅඩු හා අවුරුදු දෙකකට නොඉක්මවන කාල සීමාවක් සඳහා එක් සිරදඬුවමකට යටත් කළ හැකි ය. |
| | (2) මෙම පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ඒජන්සියක ව්‍යාපාරය කරගෙන යන සෑම පුද්ගලයෙකුම මෙම පනත යටතේ සිදුකරන සියලු ම වැරදිවලට වැරදිකරුවන් විය යුතු ය. | රුපියල් විසි දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ වරදකරු කිරීමෙන් පසුවද වරද අඛණ්ඩව සිදුකරන සෑම දිනක ම රුපියල් දහසක අතිරේක දඩයකට යටත් වේ. |
| | | |
| **63 වගන්තිය**<br>**කූට ලේඛණ සැකසීම සහ පෙළඹවීම**<br> | (අ) කිසියම් පුද්ගලයෙකුගේ රැකියා අරමුණු සඳහා සංක්‍රමණය වීමට අවශ්‍ය හෝ ඊට අදාළ ඕනෑම ලේඛනයක් ව්‍යාජ ලෙස සකස් කිරීම හෝ වෙනස් කිරීම හෝ ඔහු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ එවැනි ව්‍යාජ හෝ වෙනස් කිරීම් සඳහා භාවිතා කළ හැකි කිසියම් උපකරණයක් හෝ ලිපියක් තබාගන්නා;<br><br>(ආ) ඕනෑම තැනැත්තකු සංක්‍රමණය වීමට; මත් කිරීමෙන්, | රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයකට නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර මාස දොළහකට නොඅඩු හා අවුරුදු දෙකකට නොඉක්මවන කාල සීමාවක් සඳහා එක් සිරදඬුවමකට යටත් කළ හැකි ය. |

| | | |
|---|---|---|
| | බලහත්කාරය, වංචාව හෝ හිතාමතා ම සාවද්‍ය ලෙස නිරූපණය කිරීම, හේතු දැක්වීම හෝ පොළඹවා ගැනීම හෝ හේතු දැක්වීමට හෝ පොළඹවා ගැනීමට තැත්කරන අයකු මෙම පනත යටතේ වරදකරුවකු වේ | |
| | | |
| **64 වගන්තිය ගාස්තු අයකිරීම** | (අ) බලපත්‍රලාභියෙකු වී, වෙනත් ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවක් සැපයීම සඳහා 51 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට හැර වෙනත් ගාස්තුවක් අය කරන;<br><br>(ආ) බලපත්‍රලාභියෙකු නොවී, ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා සැපයීම සඳහා මුදල් මුදලක් ලබාගන්නා අයකු මෙම පනත යටතේ වැරදිකරුවකු වේ. | මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයකට නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු හා වසර දෙකකට නොවැඩි කාලයකට සිර ද ඬුවම් නියම කළ හැකි ය. මහේස්ත්‍රාත්වරයා විසින් වරදකරුට එම ගාස්තුව හෝ මුදල් ආපසු ලබා දෙන ලෙසට නියම කළ යුතු ය. |
| | | |
| 68 වගන්තිය | 63 වන වගන්තිය යටතේ හෝ 64 වන වගන්තිය යටතේ වරදකට වරදකරු වූ ඕනෑම පුද්ගලයෙකු පසුව එම වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබුවහොත්, එම වරදට ලබා දී ඇති දඬුවම මෙන් දෙගුණයක දඬුවමකට යටත් කළ හැකි ය. | |

### 5.3 ප්‍රතිකර්ම යාන්ත්‍රණ

අපරාධ නීතිය යටතේ වින්දිත දරුවෙකුට ලබා ගත හැකි පිළියම්වලට අමතරව, අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් ආරක්ෂා කරනු ලබන තවත් නීතිමය තත්ත්වයන් පවතී.

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව[82]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 03 වන පරිච්ඡේදය යටතේ මූලික අයිතිවාසිකම් සහතික කරන අතර විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනය කිරීමට ආසන්න වන විටක දී ඊට ප්‍රතිකර්ම සම්පාදනය කරනු ලබයි. රාජ්‍ය ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝනය වී මාසයක් ඇතුළත පෙත්සම්කරුවෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. වින්දිතයින්ට වන්දි ගෙවීම ඇතුළුව සාධාරණ සහනයක් ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය පවතී. මෙම අයිතිවාසිකම්වල විෂය පථය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කාලීනව පුළුල් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පහත සඳහන් මූලික අයිතිවාසිකම් සහතික කරනු ලබයි.

| ව්‍යවස්ථාව | මූලික අයිතිවාසිකම |
|---|---|
| 10 ව්‍යවස්ථාව | සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහස |
| 11 ව්‍යවස්ථාව | වධහිංසාවන්ගෙන්, කුරිරු අමානුෂික අවමන්සහගත සැලකීම හෝ දඬුවම් වලින් මිදීමේ අයිතිය |

[82] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 1978

| | |
|---|---|
| | |
| 12(1) සහ 12(4) ව්‍යවස්ථාව | සමානාත්මතාවයට ඇති අයිතිය සහ නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව, කාන්තාවන්, ළමුන්, සහ ආබාධිත තැනැත්තන්ගේ ප්‍රගතිය තහවුරු කිරීම |
| 12(2) ව්‍යවස්ථාව | ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය ඇතුළු හේතූන් මත වෙනස් කොට නොසැලකීම |
| 13 ව්‍යවස්ථාව | අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, දඬුවම් කිරීම සහ අතීතයට බලපාන දණ්ඩ නීති පැනවීම තහනම් කිරීම |
| 14 ව්‍යවස්ථාව | භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යාමේ ඊමේ නිදහස |

දරුවෙකුට ඔහුගේ/ ඇයගේ අයිතිවාසිකම් වැඩිහිටියෙකු හරහා නොව ස්වාධීනව භුක්ති විඳිය හැකිය. එබැවින්, වෙළෙඳාමට ගොදුරු වූ දරුවෙකුට රජයේ නිලධාරීන්ට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගත් ඕනෑම මූලික අයිතිවාසිකමක් සඳහා වූ ඔහුගේ/ ඇයගේ අයිතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. ළමයින් වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පැහැදිලිව ම ප්‍රතිපාදන සපයා නැතත්, වධහිංසාවලින් නිදහස් වීම, කුරිරු, අමානුෂික හා අවමන් සහගත ලෙස සැලකීම්වලින් නිදහස් වීම වැනි අයිතිවාසිකම් දක්වා ඇත. එමගින් සූරාකෑමේ අරමුණ සඳහා ළමයින් වෙළෙඳාම් කිරීමෙන් නිදහස් වීමේ අයිතිය පිළිගනී. තවද, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම සහ දඬුවම් කිරීමෙන් මිදීමේ නිදහස හරහා විශේෂයෙන් ලිංගික සූරාකෑමට ගොදුරු වූ ළමයින් සම්බන්ධයෙන් සහ නීතිය යටතේ වරදක් වන වෙනත් ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් රජයේ අත්තනෝමතික ක්‍රියාවන්ගෙන් නිදහස් වීමේ අයිතිය පිළිගනී.

**අභියාචනාධිකරණය සතු රිට් ආඥා නිකුත් කිරීමේ අධිකරණ බලය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ කවර හෝ මුල් අවස්ථා අධිකරණයක හෝ විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක වාර්තා පරීක්ෂා කර බලා නීතිය අනුව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩමුස්, ක්වො වොරෙන්ටෝ යන ආඥා නිකුත් කිරීම සඳහා අභියාචනාධිකරණයට පූර්ණ බලය ඇත.

141 ව්‍යවස්ථාව අනුව අභියාචනාධිකරණය වෙත පහත අවස්ථාවලදී හබයාස් කෝපුස් ආඥා නිකුත් කළ හැක

(අ) නීතිය අනුව ක්‍රියා කිරීමට යම් පුද්ගලයකු අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස

(ආ) රජයේ හෝ පුද්ගල අත්අඩංගුවේ නීතිවිරෝධී ලෙස රඳවා තබාගෙන ඇති යමෙකු අධිකරණයට ඉදිරිපත් කරන ලෙස සහ අධිකරණයට ඉදිරිපත් කරන තැනැත්තා නිදහස් කරන ලෙස හෝ රිමාන්ඩ් භාරයේ තබන ලෙස හෝ ඔහු සම්බන්ධව නීතිය අනුව අන්‍යාකාරයකින් ක්‍රියා කරන ලෙස නියම කළ හැක.

145 ව්‍යවස්ථාව අනුව අභියාචනාධිකරණය වෙත මුල අවස්ථා අධිකරණයන්ගේ වාර්තා පරීක්ෂාකිරීම සඳහා පරිශෝධන බලය පවතී.

**අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත**

2015 අංක 04 දරන අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ අරක්ෂා කිරීමේ පනතඅපරාධ වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස ද ඒ සඳහා ජාත්‍යන්තර සම්මතයන්, ප්‍රමිති සහ යහ භාවිතයන් මත පදනම්ව ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම සහ පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂක කොට්ඨාසයක් පිහිටුවීම පිණිස ද වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සපයයි.

| 3 වන වගන්තිය | 4 වන වගන්තිය සහ 5 වන වගන්තිය |
|---|---|

| | |
|---|---|
| 3 වන වගන්තිය මගින් වින්දිතයාට ගෞරවනීයව, සාධාරණත්වයෙන් හා සමානාත්මතාවයෙන් සැලකීමට ඇති අයිතිය සහ කඩිනම් සහන ලබා ගැනීමේ අයිතිය ඇතුළු පුළුල් අයිතිවාසිකම් ලැයිස්තුවක් සපයයි. ළමා වින්දිතයෙකුට සැලකීම පිළිබඳව ද මෙම වගන්තිය තුළ විශේෂ අවධානයක් යොමු කරයි. එහිදී දරුවා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් දරුවාගේ යහපත සැලකිල්ලට ගත යුතුය. තව දුරටත් එය වින්දිතයින් හානිවලින් හා තර්ජනවලින් ආරක්ෂා කරන අතර ඕනෑම ශාරීරික හෝ මානසික හානියක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට පහසුකම් සපයයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ නියෝජනය කිරීමේ අයිතිය වැනි නිසි ක්‍රියාදාම අයිතිවාසිකම් මෙම වගන්තිය මගින් සපයයි. | 3 වගන්තියේ දක්වා ඇති අයිතිවාසිකම්වලට අමතරව 4 වන වගන්තිය තුළ වින්දිතයකුගේ හිමිකම් සඳහන් වේ. වින්දිතයාට අධිකාරියෙන් මුදල් වියදම් කිරීමට (අධිකරණ හෝ අර්ධ අධිකරණ ක්‍රියාමාර්ග) සහ පවතින සම්පත් මත පදනම්ව රජයේ හෝ අධිකාරියේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුදල් ලබා ගැනීමට හිමිකම් ඇත.<br>5 වන වගන්තිය මගින් සාක්ෂිකරුවන්ට ගෞරවනීය ලෙස සැලකීමට, හිරිහැරවලින් හෝ බිය ගැන්වීම්වලින් හෝ සැබෑ හෝ විය හැකි හානියක් හෝ තර්ජනයකින් නිදහස් වීමට ඇති අයිතිය නියම කර ඇත. වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හැර වෙනත් පුද්ගලයින් ද හිරිහැර කිරීම්, බිය ගැන්වීම් තුළින් ආරක්ෂා කිරීම සඳහා ද මෙම පනත මගින් විධිවිධාන සලසා ඇත. |

**8 සිට 10 දක්වා වගන්ති මගින් පනත යටතේ දක්වා ඇති වැරදි සඳහන් කරනු ලබයි**.

**වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි**

- අපරාධ වින්දිතයකුට හෝ සාක්ෂිකරුවෙකුට තර්ජනය කිරීම හෝ එම තැනැත්තාගේ, කීර්තිනාමයට හෝ දේපළවලට හානියක් කරන, (8 (1) වගන්තිය) හෝ
- අපරාධ වින්දිතයකුට හෝ සාක්ෂිකරුවෙකුට ස්වේච්ඡාවෙන් බරපතල තුවාල කිරීම හෝ යුතු ලෙස අවහිර කිරීම (8 (2) වගන්තිය) හෝ
- බලහත්කාරයෙන්, වංචනික ලෙස, බලය අයුතු ලෙස භාවිතා කිරීම හෝ වෙනත් ආකාරයකින් වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවෙකු යම් ස්ථානයකින් පිටවීමට බල කිරීම හෝ පොළඹවා ගැනීම (8 (3) වගන්තිය) හෝ
- පැමිණිල්ලක් ගොනු කිරීම වළක්වාලීම හෝ ගොනුකරන ලද පැමිණිල්ලක් හෝ කරන ලද ප්‍රකාශයක් ඉල්ලා අස්කර ගැනීම සඳහා සාක්ෂි දීම හෝ බල කිරීම හෝ,

සිදුකරන තැනැත්තෙක් වරදක් සිදු කරයි.

සියලු ම වැරදි මහාධිකරණයේ විභාග කරනු ලබන අතර නියම කළ හැකි උපරිම සිර දඬුවමක් හා දඩයක් විශේෂයෙන් දක්වා ඇත.

වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හැර වෙනත් පුද්ගලයින්ට හිරිහැර කිරීම්, බිය ගැන්වීම් යනාදියෙන් ආරක්ෂා කිරීම සඳහා ද මෙම පනතේ ප්‍රතිපාදන සපයයි. ඒ අනුව එවැනි තැනැත්තන්ගේ රැකියාවෙහි අහිතකර වෙනස්කමක් සිදු කිරීම වැළැක්වීම (8 (4) වගන්තිය), වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම (8 (5) වගන්තිය), වැරදි සිදුකළ අයට එරෙහිව නඩු පැවරීමේ ආයතනයන්ගේ අල්ලස් හා දූෂණ ක්‍රියා වැළැක්වීම සඳහා ද (8 (6) වගන්තිය) ප්‍රතිපාදන දක්වා ඇත.

**ඉහත සියලු වැරදි <u>ඇප ලබාදිය නොහැකි සංඥෙය වැරදි</u> වේ.**

ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික මෙහෙවරක් (තානාපති කාර්යාලයක්)හරහා ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා මගින් සාක්ෂි ලබාදීමට සාක්ෂිකරුවන් වෙත පහසුකම් සැපයීම සඳහා මෙම පනතට පසුකාලීනව සංශෝධනයක් එක් කරන ලදී.